# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1882/51 - 2014 ඔක්තෝබර් මස 03 වැනි සිකුරාදා - 2014.10.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය පනත**

2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය පනතේ 5 (ඉ) වගන්තිය සමග කියැවිය යුතු 20 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් සාදන ලද නියමාවලිය

සභාපති,
පාලක මණ්ඩලය,
වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය.

2014 සැප්තැම්බර් මස 25 වැනි දින,
වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය,
රත්මලාන.

නියමාවලිය

1. මෙම නියමාවලිය 2014 අංක 1 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලිය ලෙස හඳුන්වනු ලැබිය හැකි අතර 2014 ඔක්තෝබර් මස 1 වැනි දින බලාත්මක විය යුතු ය.

2. මෙම නියමාවලියේ විධිවිධාන මගින් ස්ථාපනය කරනු ලබන, මෙහි පරිශිෂ්ටයේ දක්වා ඇති විශේෂීකෘත ආයතනයන් (මෙහි මින් මතුවට 'විද්‍යායතනය' යනුවෙන් හඳුන්වනු ලබන) සම්බන්ධයෙන් බල පැවැත්වේ.

3. විද්‍යායතනය වනාහි වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට (මෙහි මින් මතුවට 'විශ්වවිද්‍යාලය' යනුවෙන් හඳුන්වනු ලබන) අනුබද්ධ ආයතනයක් විය යුතු ය.

4. පනතේ 5 (ඉ) වගන්තියේ හා අන් කවර හෝ උචිත සාධනපත්‍රයක විධිවිධානයන්ට යටත්ව, විද්‍යායතනයකට:-

   (අ) විශ්වවිද්‍යාලය විසින් අනුමත කරනු ලබන අයුරින්, ජාතික වෘත්තීය සුදුසුකම් 5, 6 හා 7 මට්ටමේ පාඨමාලා සහ ඒ සමාන මට්ටම්වල වෙනත් තාක්ෂණවේද පාඨමාලා මෙහෙයවීම ;


1A - G 20360— 05 (2014/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) විශ්වවිද්‍යාලයේ අනුමැතිය ඇතිව, ජාතික වෘත්තීය සුදුසුකම් පාඨමාලා සහ ඒ හා සමාන මට්ටමේ තාක්ෂණවේද පාඨමාලා (මෙහි මින් මතුවට ''අධ්‍යයන පාඨමාලා'' යනුවෙන් හඳුන්වනු ලබන) සඳහා ප්‍රවීණත්වය අත්කර ගෙන ඇති තැනැත්තන් නිශ්චය කිරීමේ කාර්යය සඳහා විභාග පැවැත්වීම සහ එම විභාග සමත් වී සහ ඒ වෙනුවෙන් විශ්වවිද්‍යාලය විසින් සාදනු ලබන අතුරු නීති මගින් පනවනු ලැබිය හැකි වෙනත් කොන්දේසි සපුරා උපාධි, ඩිප්ලෝමා, සහතික පත්‍ර හා වෙනත් අධ්‍යයන සාමාර්ථයන් පිරිනමනු ලැබීමට සුදුසුකම් ලබන තැනැත්තන් විශ්වවිද්‍යාලය වෙත නිර්දේශ කිරීම ;

(ඇ) විශ්වවිද්‍යාලයේ අනුමැතිය ඇතිව, අන් කවර හෝ අධ්‍යයන පාඨමාලා සඳහා පිරිනැමිය යුතු උපාධි, ඩිප්ලෝමා, සහතික පත්‍ර හා වෙනත් අධ්‍යයන සාමාර්ථයන් නිර්ණය කිරීම ;

(ඈ) විද්‍යායතනයකට ඇතුළත් වීමට අපේක්ෂා කරන තැනැත්තන් සඳහා ඉගෙනුම් හෝ අධ්‍යයන කාලපරිච්ඡේද සහ ඔවුන් සමත් වන විභාගවල පිළිගැනීම සම්බන්ධයෙන් පනවන ලද කවර හෝ උචිත සාධනපත්‍රවලට අනුකූල වන පරිද්දෙන්, ඒ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයට නිර්දේශ ඉදිරිපත් කිරීම සහ එම පිළිගැනීම ඉවත් කර ගැනීම ;

(ඉ) අධ්‍යයන මණ්ඩලයේ එකඟත්වය ඇතිව, විද්‍යායතනයක් විසින් මෙහෙයවනු ලබන යම් ඩිප්ලෝමා හෝ කර්මාන්ත දිශාභිමුඛ සහතික පත්‍ර පාඨමාලාවන්ට ඇතුළත් වීම සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තිබිය යුතු සුදුසුකම් කවරේදැයි විශ්වවිද්‍යාලය වෙත නිර්දේශ කිරීම සහ විශ්වවිද්‍යාලය සමග සාකච්ඡා කොට ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඇතුළත් කර ගැනීම ;

(ඊ) විශ්වවිද්‍යාලයේ අනුමැතිය ඇතිව, බාහිර ආයතන වෙතින් පාඨමාලා සඳහා ප්‍රතීතන තත්ත්ව පාලන සහතිකය ලබා ගැනීමට කටයුතු කිරීම ;

(උ) විද්‍යායතනයක කාර්යයන් සඳහා පුස්තකාල, පර්යේෂණාගාර සහ වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම, උපකරණවලින් සන්නද්ධ කිරීම සහ නඩත්තු කිරීම ;

(එ) විශ්වවිද්‍යාලයේ අනුමැතිය ඇතිව, විද්‍යායතනයක කාර්යයන් සඳහා අවශ්‍ය වන පරිදි අධ්‍යයන, පරිපාලන හා වෙනත් තනතුරු ඇති කිරීම සහ එවැනි කවර හෝ තනතුරක් අහෝසි කිරීම හෝ අත්හිටුවීම ;

(ඒ) ගාස්තු අය කිරීමේ කාර්යය සඳහා පනවනු ලබන කවර හෝ උචිත සාධනපත්‍රයකට අනුකූලව ගාස්තු අය කිරීම සහ ලැබීම ;

(ඔ) ඉහත සඳහන් කරන ලද බලතල ක්‍රියාවේ යෙදවීමෙහිලා අවශ්‍ය විය හැකි සියලු ක්‍රියාවන් හා දේ සිදු කිරීම සඳහා බලය තිබිය යුතුය.

5. පහත සඳහන් තැනැත්තෝ ආයතනයේ නිලධරයෝ වන්නාහ.

(අ) විද්‍යායතන අධ්‍යක්ෂ ; (මෙහි මින් මතුවට ''අධ්‍යක්ෂ'' යනුවෙන් හඳුන්වනු ලබන) සහ

(ආ) විද්‍යායතන ලේඛකාධිකාරී

6. (1) අධ්‍යක්ෂවරයා පත් කිරීම විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් සිදු කරනු ලැබිය යුතු වන අතර, ඔහු විද්‍යායතනයේ ප්‍රධාන විධායක නිලධාරී විය යුතු ය.

(2) (අ) නියමිත කාලයට පෙර සේවය හැර ගිය හොත් හෝ පහ කරනු ලැබුව හොත් හැර, අධ්‍යක්ෂවරයා සිය පත්වීම් දිනයේ සිට අවුරුදු තුනක කාලපරිච්ඡේදය හෝ සිය හැට වන විය යන දෙකෙන් පළමුවැන්න සම්පූර්ණ කරන දිනය දක්වා සිය නිලය දැරිය යුතු ය.

(ආ) කිසිදු පුද්ගලයකු අනුගාමී නිල කාලයන් දෙකකට වඩා වැඩි ගණනක් සඳහා අධ්‍යක්ෂ වශයෙන් පත් කරනු නොලැබිය යුතුය.

(3) අධ්‍යක්ෂවරයා ඉවත් කිරීමේ කාර්යය සඳහාම කැඳවනු ලබන, විද්‍යායතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් විසින් තමන් අතරින් තෝරා පත් කර ගනු ලබන අයකු විසින් මූලාසනය දරනු ලැබිය යුතු, එම මණ්ඩලයේ විශේෂ රැස්වීමකදී, එම මණ්ඩලයේ මුළු සාමාජිකත්වයෙන් තුනෙන් දෙකකට නො-අඩු සාමාජික සංඛ්‍යාවක් විසින් සම්මත

කරනු ලබන දෝෂාරෝපණ යෝජනාවක් මත විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයා එම නිලයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) අසනීප වීම, ශ්‍රී ලංකාවෙහි නොසිටීම හෝ එවැනි වෙනත් කාරණාවක් හේතුවෙන් අධ්‍යක්ෂවරයාට සිය පදවියේ රාජකාරි ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන්නේ නම්, එවැනි නොහැකියාවක් ඇති වී දින හතක් ඇතුළත විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා (මෙහි මින් මතුවට ''උපකුලපතිවරයා' ලෙස හඳුන්වනු ලබන) උචිත යැයි තමන් සිතන අයුරින් අධ්‍යක්ෂවරයාගේ නිලයේ රාජකාරි ඉටු කිරීම සඳහා විධිවිධාන සැලැස්විය යුතු ය. එවැනි විධිවිධාන සලස්වනු ලබන තෙක්, විද්‍යායතනයේ ලේඛකාධිකාරීවරයා නිලයේ එදිනෙදා රාජකාරි ඉටු කළ යුතුය.

(5) අධ්‍යක්ෂ නිලයේ පුරප්පාඩුවක් ඇති වුව හොත්, එම පුරප්පාඩුව ඇති වී දින හතක් ඇතුළත උපකුලපතිවරයා උචිත යැයි තමන් සිතන අයුරින් අධ්‍යක්ෂවරයාගේ නිලයේ රාජකාරි ඉටු කිරීම සඳහා විධිවිධාන සැලැස්විය යුතු ය. එම විධිවිධාන සලස්වනු ලබන තෙක්, විද්‍යායතනයේ ලේඛකාධිකාරීවරයා අධ්‍යක්ෂ නිලයේ එදිනෙදා රාජකාරි ඉටු කළ යුතුය.

(6) අධ්‍යක්ෂවරයා විසින්

(අ) අදාළ පරිදි විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් කලින් කලට නිකුත් කළ හැකි විධානයන්ට අනුකූලව, පනතේ සහ උචිත කවර හෝ සාධනපත්‍රයක විධිවිධාන විද්‍යාතනයට අදාළ වන හා සම්බන්ධ වන ප්‍රමාණයට ඒවා නිසි පරිදි අනුගමනය කෙරෙන බවට වග බලා ගැනීම සහ එම කාර්යය සඳහා අවශ්‍ය වෙතැයි තමා සලකන සියලුම බලතල ක්‍රියාවෙහි යෙදවීම ;

(ආ) විද්‍යායතනයේ කළමනාකරණ මණ්ඩලයේ සියලුම තීරණයන් බලාත්මක කිරීම හෝ බලාත්මක කෙරෙන බවට වග බලා ගැනීම ;

(ඇ) විද්‍යායතනය ඇතුළත විනය පවත්වා ගැනීම ; සහ

(ඈ) විද්‍යායතනයේ ක්‍රියාකාරකම් පිළිබඳව වාර්ෂික වාර්තාවක් පිළියෙළ කිරීම ;

(7) ලේඛකාධිකාරිවරයා විසින්

(අ) අධ්‍යක්ෂවරයාගේ මග පෙන්වීමට හා අධීක්ෂණයට යටත්ව, විද්‍යායතනයේ පොදු පරිපාලනය පිළිබඳව හා එහි අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විනය පරිපාලනය සඳහා වගකීම දැරීම ;

(ආ) විද්‍යායතනයේ වාර්තා සහ දේපළ භාරකාරත්වය සඳහා වගකීම දැරීම ;

(ඇ) මෙම නියමාවලිය හෝ කවර හෝ උචිත සාධනපත්‍රයක් මගින් පිරිනමා, පනවා හෝ පවරා ඇති බලතල, රාජකාරි හෝ කාර්යයන් ක්‍රියාවේ යෙදවීම, සිදුකිරීම හා ඉෂ්ට කිරීම

7. පහත දැක්වෙන බල මණ්ඩල, විද්‍යාතනයේ බල මණ්ඩල වන්නේය.

(අ) කළමනාකරණ මණ්ඩලය ;

(ආ) අධ්‍යයන මණ්ඩලය ; සහ

(ඇ) නියමාවලියක් මගින් නිර්දිෂ්ට කරනු ලැබිය හැකි එබඳු අන් ආයතන

8. උපකුලපති විසින් පත් කරනු ලබන, කළමනාකරණ මණ්ඩලයක් තිබිය යුතු වන අතර, (මෙම නියමාවලියෙහි මින් මතුවට ''මණ්ඩලය'' යනුවෙන් හඳුන්වනු ලබන) එය අධ්‍යයන හා විධායක සභාව විය යුතුය.

(අ) නිල බලයෙන්ම පත් වන

(i) අධ්‍යක්ෂවරයා ; හා

(ii) ලේකම්වරයා හෝ ඔහුගේ නාමයෝජිත ; සහ

(ආ) පත් කරනු ලබන සාමාජිකයින් වන

(i) පාලක මණ්ඩලය විසින් සිය සාමාජිකයින් අතරින් නාමයෝජනා කරනු ලබන එක් තැනැත්තෙක්;

(ii) අධ්‍යයන මණ්ඩලය විසින් 13.1 (ඉ) යටතේ වූ සාමාජිකයින් නොවන සිය සාමාජිකයින් අතරින් තෝරා ගනු ලබන තැනැත්තන් දෙදෙනෙක් ; සහ

(iii) විශ්වවිද්‍යාලය විසින් කර්මාන්තය තුළ සුවිශේෂී සේවාවක් ඉටු කර ඇති තැනැත්තන් අතරින් නාමයෝජනා කරනු ලබන තැනැත්තන් දෙදෙනෙක්

යන අයගෙන් සමන්විත විය යුතු ය.

9. (1) අධ්‍යක්ෂවරයා මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු වන අතර මණ්ඩලයේ සියලුම රැස්වීම්වලදී මූලසුන දැරිය යුතු ය. මණ්ඩලයේ කවර හෝ රැස්වීමකදී සභාපතිවරයා නොසිටින විට, එම රැස්වීමට පැමිණ සිටින සාමාජිකයෝ එම රැස්වීමේදී මූලසුන දරනු පිණිස පැමිණ සිටින සිය සාමාජිකයින් අතරින් අයකු තෝරා පත් කර ගත යුතු ය.

(2) විද්‍යායතනයේ ලේඛකාධිකාරීවරයා මණ්ඩලයේ ලේකම් විය යුතු ය.

(3) නියමිත කාලයට පෙර නිලය හැර ගිය හොත් හැර, මණ්ඩලයේ පත් කරන ලද සාමාජිකයෙක් සිය පත්වීම් දිනයේ සිට අවුරුදු තුනක කාලපරිච්ඡේදයක් සඳහා නිලය දැරිය යුතු වන අතර, නිලයෙන් පහ කරනු ලැබුව හොත් හැර, යළි පත් කරනු ලැබීමටද සුදුසු වේ.

කවර හෝ පත් කරන ලද සාමාජිකයෙක් සිය නිල කාලය ඉකුත් වීමට පෙර සිය නිලය හැර ගිය හොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා නිලය හැර යන සාමාජිකයාගේ ඉකුත් නොවී ඉතිරිව ඇති නිල කාලය ඉකුත් වීමට පෙර ඉවත් වුව හොත් හැර, එම ඉතිරිව ඇති නිල කාලය සඳහා නිලය දැරිය යුතුය යනුවෙන්ද විධිවිධාන සලස්වනු ලැබේ.

(4) මණ්ඩලයේ කවර හෝ පත් කරන ලද සාමාජිකයකුට උපකුලපතිවරයා අමතන ලද ලිඛිත ඉල්ලීමක් මගින් සිය නිලයෙන් ඉල්ලා අස්වීමට හැකිය.

(5) උපකුලපතිවරයා හට පත් කරන ලද සාමාජිකයකු නිසි හේතු දක්වමින් නිලයෙන් ඉවත් කළ හැකි ය.

(6) මණ්ඩලයේ රැස්වීමට නොපැමිණීමට අවසර ලබා නොගෙන මණ්ඩලයේ අනුගාමී රැස්වීම් තුනකටම පැමිණීමට අසමත් වන මණ්ඩලයේ පත් කරන ලද කවර සාමාජිකයකු වුවද මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් වූ සිය නිලය හැර ගියා සේ සලකනු ලැබිය යුතු ය.

(7) ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම හෝ ඉහත (6) ඡේදයේ විධිවිධාන ක්‍රියාත්මක වීම හේතුවෙන් පත් කරන ලද සාමාජිකත්වය තුළ ඇති වන පුරප්පාඩුවක් පිරවීම මෙම නියමාවලියේ 8 ඡේදයේ (ආ) අනුඡේදය යටතේ සාමාජිකයකු පත් කිරීම සඳහා විධිවිධාන සලස්වා ඇති ආකාරයටම සිදු කරනු ලැබිය යුතු ය.

10. (1) මණ්ඩලයේ කවර හෝ රැස්වීමක් සඳහා වන ගණපූරණය එහි සාමාජිකත්වයෙන් හතර දෙනෙක් විය යුතු ය.

(2) මණ්ඩලය එක් එක් වර්ෂය තුළ අට වතාවකට අඩු නොවන වාර ගණනක් කවර ලෙසකින් හෝ රැස් වන පරිද්දෙන්, අවශ්‍ය කවර විටෙක වුවද රැස්විය යුතු ය.

(3) මණ්ඩලයේ සභාපතිවරයා හට විශේෂ රැස්වීමක් කැඳවීම අවශ්‍ය යැයි ඔහු සලකන විට, හෝ විශේෂ රැස්වීමක් කැඳවන ලෙස මණ්ඩලයේ මුළු සාමාජිකත්වයෙන් තුනෙන් එකකට අඩු නොවන සාමාජික සංඛ්‍යාවක් විසින් කෙරෙන ලිඛිත ඉල්ලීමක් ඔහු වෙත ලැබී සතියක් ඇතුළත, මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවිය හැකි ය.

11. විද්‍යායතනයේ සේවකයකු වන මණ්ඩලයේ සාමාජිකයකුට මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් කටයුතු කිරීම වෙනුවෙන් කිසිදු පාරිශ්‍රමිකයක් සඳහා හිමිකමක් නොතිබිය යුතු ය. කෙසේ වුවද, මුදල් විෂයය භාර අමාත්‍යවරයා සමග සාකච්ඡා කොට අමාත්‍යවරයා විසින් නිර්ණය කරනු ලබන පාරිශ්‍රමිකයක් අනෙකුත් සාමාජිකයින්ට ගෙවනු ලැබිය හැකි ය.

12. (1) මෙම නියමාවලියේ සහ අදාළ කාරණය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය විසින් පනවනු ලබන කවර හෝ උචිත සාධනපත්‍රයක විධිවිධානයන්ට යටත්ව, මණ්ඩලය මෙම නියමාවලියේ 4 ඡේදය මගින් විද්‍යායතනය මත පවරනු ලබන බලතල, රාජකාරි හා කාර්යයන් ක්‍රියාවේ යෙදවීම, සිදු කිරීම හා ඉෂ්ට කිරීම සිදු කළ යුතු ය.

(2) ඉහත (1) වන අනුඡේදය මගින් මණ්ඩලය මත පවරා ඇති බලතලවල පොදු භාවයට අගතියක් ඇති නොවන පරිද්දෙන්, මණ්ඩලය :-

(අ) විශ්වවිද්‍යාලයේ අනුමැතිය ඇතිව, විද්‍යායතනයේ ආචාර්යවරුන් සහ වෙනත් පරිපාලන නිලධාරීන් හා සේවකයින් පත් කිරීම ;

(ආ) අධ්‍යයන මණ්ඩලය සමග එකගත්වය සහිතව,

(i) විද්‍යායතනය විසින් මෙහෙයවනු ලබන විවිධ අධ්‍යයන පාඨමාලා සඳහා පිරිනමනු ලැබිය යුතු උපාධි, ඩිප්ලෝමා, සහතික පත්‍ර හා වෙනත් අධ්‍යයන සාමාර්ථයන් ;

(ii) විද්‍යායතනය විසින් පිරිනමනු ලබන උපාධි හා වෙනත් අධ්‍යයන සාමාර්ථයන් සඳහා සුදුසුකම් ලැබීමට අපේක්ෂා කරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සපුරාලිය යුතු අධ්‍යයන පාඨමාලා සහ පුහුණුව සහ සපුරාලිය යුතු වෙනත් කොන්දේසි ;

(iii) විද්‍යායතනයේ විභාග ප්‍රශ්න පත්‍ර පරීක්ෂකයින් වශයෙන් පත්වීම සඳහා සුදුසු තැනැත්තන් ; සහ

(iv) සම්මාන සාමාජිකත්වයන්, ශිෂ්‍යත්ව, ජාත්‍ර දක්ෂිණා, ශිෂ්‍යාධාර, පදක්කම් හා වෙනත් ත්‍යාග සඳහා වූ තරගවල ආකාරය සහ කොන්දේසි ;

පිළිබඳව විශ්වවිද්‍යාලයට නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ඇ) විද්‍යායතනයට පත් කෙරෙන ආචාර්යවරුන් සහ වෙනත් පරිපාලන නිලධාරීන් හා සේවකයින් හට තිබිය යුතු සුදුසුකම් පිළිබඳව විශ්වවිද්‍යාලයට නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ඈ) විද්‍යායතනයේ කාර්ය මණ්ඩලයේ සිටින තැනැත්තන් ගේ සේවය අත්හිටුවීම, ඔවුන් සේවයෙන් පහ කිරීම හෝ ඔවුන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා විශ්වවිද්‍යාලයට නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ඉ) සම්මාන සාමාජිකත්වයන්, ශිෂ්‍යත්ව, ජාත්‍ර දක්ෂිණා, ශිෂ්‍යාධාර, පදක්කම් හා වෙනත් ත්‍යාග ඇති කිරීම හා පිරිනැමීම සම්බන්ධයෙන් සාදන ලද කවර හෝ උචිත සාධනපත්‍රවලට අනුකූලව ඒවා සිදු කිරීම ;

(ඊ) අධ්‍යයන පාඨමාලා හෝ අධ්‍යයන පාඨමාලාවන්හි කවර හෝ කොටස් විද්‍යායතනයෙන් පිටත ස්ථානයන්හිදී මෙහෙයවනු පිණිස විශ්වවිද්‍යාලය විසින් සාදන ලද කවර හෝ අතුරු නීතියකට අනුකූලව එය සිදු කිරීම ;

(උ) විශ්වවිද්‍යාලයේ එකගත්වය ඇතිව, විද්‍යායතනයේ අධ්‍යයන පාඨමාලාවන්ට සමාන හෝ සැලකිය යුතු තරමින් සමාන අධ්‍යයන පාඨමාලා ඇති ශ්‍රී ලංකාවේ හෝ විදේශයක පිහිටි විශ්වවිද්‍යාල හෝ ආයතන සමග ආචාර්යවරුන්, ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ විද්‍යාර්ථීන් හුවමාරුවක ආකාරයෙන් හෝ අන්‍යාකාරයකින් සහයෝගිතාවය ඇති කර ගැනීම ;

(ඌ) විද්‍යායතනයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්, ආචාර්යවරුන්, නිලධාරීන් හා වෙනත් සේවකයින් ගේ නේවාසික පහසුකම්, විනය හා පොදු යහපැවැත්ම නියාමනය කිරීම හා ඒ සඳහා කටයුතු සම්පාදනය කිරීම ;

(එ) විද්‍යායතනයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා නේවාසික ශාලා පහසුකම් ස්ථාපනය කොට කළමනාකරණය කිරීම, නේවාසික පහසුකම් ලබා දිය හැකි නවාතැන් ස්ථාන සඳහා බලපත්‍ර ලබා දීම සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවශ්‍ය විය හැකි වෙනත් සේවාවන් හා පහසුකම් සපයා දීම ;

(ඒ) කවර හෝ උචිත සාධනපත්‍රයකට අනුකූලව, බැංකු හා වෙනත් නියෝජිතායතනයන් වෙතින් ණය ලබා ගැනීමට විද්‍යායතනයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සහාය වීම ;

(ඔ) අවශ්‍ය හෝ උචිත යැයි හැඟෙන ස්ථාවර කමිටු හෝ තත්කාර්ය කමිටු සංඛ්‍යාවක් පත් කිරීම, එබඳු කමිටුවල ආශ්‍රේය නියමයන් නිශ්චය කිරීම සහ එම කමිටු විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සලකා බැලීම හා වෙනස් කිරීම් සහිතව හෝ රහිතව අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම ;

(ඕ) විශ්වවිද්‍යාලය වෙනුවෙන් විද්‍යායතනයේ දේපළ හා අරමුදල් දැරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම ;

(ක) විශේෂිත කාර්යයන් සඳහා විද්‍යායතනයේ පරිහරණයට තබා ඇති කවර හෝ අරමුදල් පරිපාලනය කිරීම ;

(ග) විද්‍යායතනයේ මූල්‍ය ඇස්තමේන්තු පිළියෙළ කිරීම හා එම ඇස්තමේන්තු ව්‍යාපාරික සැලැස්මද සමගින් විශ්වවිද්‍යාලය හා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම ;

(ජ) විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව, විද්‍යායතනයේ නමට අන්තිම කැමති පත්‍රවලින් පවරනු ලබන දේ, ලබා දෙන පරිත්‍යාග හා අන් කවර හෝ දේපළ ප්‍රදානයන් ලැබීම හා භාර ගැනීම ;

(ට) විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව හා විගණනය කරන ලද වාර්ෂික ගිණුම් සලකා බැලීම හා එම වාර්තාව හා ගිණුම් විශ්වවිද්‍යාලය වෙත හා අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කිරීම ;

(ඩ) විද්‍යායතනයේ ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා අවශ්‍ය වන ගොඩනැගිලි, පරිශ්‍ර, ගෘහභාණ්ඩ, උපකරණ හා වෙනත් ද්‍රව්‍ය සපයා දීම ;

(ණ) විද්‍යායතනයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගේ පොදු යහපැවැත්ම ප්‍රවර්ධනය කරනු පිණිස ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගේ නියෝජිතයන්ද ඇතුළත් විය යුතු සුභසාධන මණ්ඩලයක් පත් කිරීම සහ එහි සංයුතිය, බලතල, රාජකාරි හා කාර්යයන් නියම කිරීම ;

(ත) අධ්‍යයන පාඨමාලා සහ විභාග ආශ්‍රිතව වන කවර හෝ නිර්දේශයන් ඒ සම්බන්ධයෙන් අධ්‍යයන මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන කවර හෝ වාර්තාවක් සලකා බැලීමෙන් පසුව විනා ඉදිරිපත් කරනු නොලැබිය යුතුය යන විධිවිධානයට යටත්ව -

මෙම නියමාවලිය යටතේ මණ්ඩලයේ බලතල, රාජකාරි හා කාර්යයන් ආශ්‍රිතව පනත යටතේ පාලක මණ්ඩලය වෙත සෑදීමට බලය පැවරී ඇති කවර හෝ උචිත සාධනපත්‍රයක් පිළිබඳව පාලක මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ද) පනතේ, මෙම නියමාවලියේ සහ කවර හෝ අදාළ වන උචිත සාධනපත්‍රයක විධිවිධානයන්ට අනුකූලව විද්‍යායතනය සම්බන්ධයෙන් වූ සියලුම කාරණාවන් නියාමනය කිරීම හා නිර්ණය කිරීම ; සහ

(න) ඉහත දක්වා ඇති ඒවාට ආනුෂංගික වන අන් බලතල, රාජකාරි හා කාර්යයන් ක්‍රියාවේ යෙදවීම යන බලතල, රාජකාරි හා කාර්යයන් ක්‍රියාවේ යෙදවීම, සිදු කිරීම හා ඉෂ්ට කිරීම සිදු කළ යුතු ය.

(3) කවර හෝ අධ්‍යයන කටයුත්තක් සම්බන්ධයෙන් වුවද, පළමුව අධ්‍යයන මණ්ඩලයට ඒ පිළිබඳව සටහන් කොට ගෙන සිය මතය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට අවස්ථාව දී විනා මණ්ඩලය කිසිදු තීරණයක් ඒ සම්බන්ධයෙන් සම්මත නොකළ යුතු ය.

කෙසේ වුවද, විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව හැර එසේ සම්මත කරන ලද කිසිදු තීරණයක් අනුව කටයුතු කිරීම නොකළ යුතු ය. මෙම ඡේදයෙහි ''අධ්‍යයන කටයුත්ත'' යන්නෙන් විශ්වවිද්‍යාලයේ අධ්‍යයන මණ්ඩලයේ සහ අධ්‍යයන සභාවේ පාලනයට හා පොදු විධානයට යටත් කවර හෝ කාරණයක් අදහස් කෙරේ.

13. (1) අධ්‍යයන මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු වන අතර, එය

(අ) එහි සභාපතිවරයා බවට පත් විය යුතු අධ්‍යක්ෂවරයා ;

(ආ) විද්‍යායතනයේ පුස්තකාලය භාර පුද්ගලයා ;

(ඇ) විද්‍යායතනයේ ස්ථිර ආචාර්යවරු ;

(ඇ) කර්මාන්ත පුහුණුව භාර ආචාර්යවරයා ;

(ඉ) විද්‍යායතනයේ පංති නියෝජිතයන් අතුරින් තෝරා පත් කර ගනු ලබන ශිෂ්‍ය-ශිෂ්‍යාවෝ දෙදෙනෙක් ;

(ඊ) විද්‍යායතනයට අදාළ වන්නා වූ කවර හෝ අධ්‍යයන ක්ෂේත්‍රයක විද්වත් පුද්ගලයින් අතරින්, මණ්ඩලය විසින් තෝරා පත් කර ගනු ලබන විද්‍යායතනයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් නොවන තැනැත්තන් දෙදෙනෙක් ;

යන තැනැත්තන් ගෙන් සමන්විත විය යුතු ය.

(2) නියමිත කාලයට පෙර නිලය හැර ගිය හොත් හැර, ඉහත (1) (ඉ) අනුඡේදයේ සඳහන් සාමාජිකයන්ගේ නිල කාලය අවුරුද්දක් වන අතර සෙසු සාමාජිකයන්, නියමිත කාලයට පෙර නිලය හැර ගිය හොත් හැර, තෝරා පත් කර ගනු ලැබූ දිනයේ සිට ගණන් ගන්නා අවුරුදු තුනක කාලපරිච්ඡේදයක් සඳහා නිලය දරන අතර, නිලයෙන් ඉවත් කරනු නොලැබුවහොත් යළි තෝරා පත් කර ගනු ලැබීමටද සුදුසුකම් ලබයි :

තෝරා පත් කර ගනු ලැබූ සාමාජිකයකු තමන් අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් තෝරා පත් කරනු ලැබීමට සුදුසුකම් ලැබුවේ යම් තරාතිරමක හෝ තනතුරක මහිමයෙන්ද, එම තරාතිරම හෝ තනතුර දරන තාක් පමණක් සිය නිලය දැරිය යුතු ය යනුවෙන්ද විධිවිධාන සලස්වනු ලැබේ.

(3) තෝරා පත් කරන ලද සාමාජිකයෙක් සිය නිල කාලය ඉකුත් වීමට පෙර සිය නිලය හැර ගිය හොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා ලෙස තෝරා පත් කර ගනු ලැබූ තැනැත්තා සිය නිලයෙන් ඉවත් වුව හොත් හැර, සිය පූර්වගාමියාගේ ඉකුත් නොවී ඉතිරිව ඇති නිල කාලය සඳහා නිලය දැරිය යුතුය.

(4) ඉහත (1) (ඉ) අනුඡේදය යටතේ තෝරා පත් කර ගනු ලබන සාමාජිකයින් විභාග සහ ඒ හා සම්බන්ධ වෙනත් කාරණා පිළිබඳව වූ අධ්‍යයන මණ්ඩල රැස්වීම්වලට සහභාගි කර නොගත යුතු වන අතර, එසේ ඔවුන් ඉවත් කිරීම නොතකා, එබඳු කවර හෝ රැස්වීමක් වුවද නිසි පරිදි පවත්වනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) ඉහත (1) (ඉ) හා (ඊ) අනුඡේද යටතේ තෝරා පත් කර ගනු ලැබූ කවර හෝ සාමාජිකයකුට වුවද අධ්‍යක්ෂවරයා අමතන ලිඛිත ඉල්ලීමක් මගින් සිය නිලයෙන් ඉල්ලා අස්විය හැකිය.

(6) අධ්‍යයන මණ්ඩලයේ රැස්වීමක් සඳහා වූ ගණපූරණය, (4) අනුඡේදයේ විධිවිධානයන්ට යටත්ව එහි මුළු සාමාජිකත්වයෙන් තුනෙන් එකක් විය යුතු වන අතර, මණ්ඩලය එක් එක් වර්ෂය තුළ දස වතාවකට නොඅඩු වාර ගණනක් කවර ලෙසකින් හෝ රැස් වන පරිද්දෙන්, අවශ්‍ය කවර විටෙක වුවද රැස්විය යුතු ය.

14. (1) පනතේ හා කවර හෝ උචිත සාධනපත්‍රයක විධිවිධානයන්ට යටත්ව, අධ්‍යයන මණ්ඩලය විද්‍යායතනයේ ඉගැන්වීමෙහි, අධ්‍යාපනයෙහි හා පර්යේෂණයෙහි පොදු පාලනය හා මග පෙන්වීම සඳහා සහ එහි විභාගය පැවැත්වීම සඳහා වගකිව යුතු වෙයි.

(2) ඉහත (1) අනුඡේදය මගින් එයට පවරා ඇති බලතලවල පොදු ස්වරූපයට අගතියකින් තොරව, අධ්‍යයන මණ්ඩලය

(අ) මණ්ඩලය විසින් එයට යොමු කරනු ලබන කවර හෝ කාරණාවක් පිළිබඳව සලකා බලා වාර්තා කිරීම ;

(ආ) (i) අධ්‍යයන පාඨමාලා, ඉගැන්වීමේ වැඩසටහන් හෝ වැඩසටහන්, සහ විභාග හා සම්බන්ධ කාරණාවන්

(ii) අධ්‍යයන පාඨමාලා සහ විභාග වෙත ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඇතුළත් කර ගැනීම සඳහා සපුරා තිබිය යුතු අවශ්‍යතාවන්;

(iii) විද්‍යායතනයේ විභාග ප්‍රශ්න පත්‍ර පරීක්ෂකයින් වශයෙන් පිළිගනු ලැබීමට සුදුසු තැනැත්තන් ;

(iv) අවශ්‍ය විභාග සමත් කොට හා අනෙකුත් කොන්දේසි සපුරා උපාධි, ඩිප්ලෝමා, සහතික පත්‍ර හා වෙනත් අධ්‍යයන සාමාර්ථයන් ප්‍රදානය කරනු ලැබීම සඳහා සුදුසු වන තැනැත්තන් ;

(v) සම්මාන සාමාජිකත්වයන්, ශිෂ්‍යත්ව, ජාත්‍ර දක්ෂිණා, ශිෂ්‍යාධාර, පදක්කම් හා වෙනත් ත්‍යාග සඳහා වූ තරඟවල ආකාරය සහ කොන්දේසි ;

(vi) සම්මාන සාමාජිකත්වයන්, ශිෂ්‍යත්ව, ජාත්‍ර දක්ෂිණා, ශිෂ්‍යාධාර, පදක්කම් හා වෙනත් ත්‍යාග ප්‍රදානය කරනු ලැබීම සඳහා සුදුසු වන තැනැත්තන්ගේ නම්

පිළිබඳව මණ්ඩලය වෙත නිර්දේශ සහ වාර්තා ඉදිරිපත් කිරීම සහ

(ඈ) අධ්‍යයන මණ්ඩලය විසින් එය වෙත යොමු කරනු ලබන කවර හෝ විශේෂ විෂයයක් හෝ විෂයයන් පිළිබඳව සලකා බැලීමේ හා ඒ පිළිබඳව වාර්තා කිරීමේ කාර්යය සඳහා තමාගේම සාමාජිකයින් නොවන තැනැත්තන් වුවද ඇතුළත් විය හැකි කමිටු පත් කිරීම.

සිදු කළ යුතු ය.

15. (1) විද්‍යායතනයකට 'විද්‍යායතන අරමුදල ' නමින් හඳුන්වන (මෙහි මින් මතුවට ''අරමුදල'' යනුවෙන්හඳුන්වනු ලබන) අරමුදලක් තිබිය යුතු වන අතර, එයට :-

(අ) කවර හෝ උචිත සාධනපත්‍රයකට අනුකූලව ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් ගෙවනු ලබන සියලුම ගාස්තු ;

(ආ) පරිත්‍යාග ආදියෙන් ලැබෙන සියලුම ආදායම් ;

(ඇ) පාර්ලිමේන්තුව විසින් ප්‍රදානයන් වශයෙන් විද්‍යායතනය වෙත ලබා දෙනු ලබන සියලුම ආදායම් ; සහ

(ඈ) කවර හෝ මූලාශ්‍රයක් වෙතින් විද්‍යායතනය වෙත උපචය වන වෙනත් මුදල්

බැර කරනු ලැබිය යුතු ය.

(2) මාසයක් තුළ අරමුදලට බැර කරන ලද සියලුම මුදල් පිළිබඳව සාරාංශයක් උචිත ආදායම් ශීර්ෂ යටතේ වර්ගීකරණය කොට, ඊට පසුව එළඹෙන මාසයේ අවසානයට පෙර අධ්‍යක්ෂවරයා විසින් විශ්වවිද්‍යාලය වෙත හා අමාත්‍යාංශ ලේකම්වරයා වෙත දැන ගැනීම පිණිස ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

16. (1) අධ්‍යක්ෂවරයා විද්‍යායතනයේ ගණන් දීමේ නිලධාරිවරයා විය යුතු ය.

(2) එමෙන්ම ගණන් දීමේ නිලධාරිවරයා වශයෙන්,

(අ) මණ්ඩලය විසින් නිර්ණය කරනු ලැබිය හැකි ආකාරයකට විද්‍යායතනයේ ගිණුම් පවත්වා ගෙන යාම ;

(ආ) අරමුදල තුළට ගෙවනු ලබන සියලුම මුදල් ලැබීම හා එම මුදල් නිසි ගිණුම් ශීර්ෂයන්ට බැර කිරීම ;

(ඇ) සියලුම බලය පවරන ලද ගෙවීම් සිදු කිරීම ;

(ඈ) විශ්වවිද්‍යාලය විසින් නියම කරනු ලබන පරිදි වූ ඇස්තමේන්තු සහ අනතුරුව එළඹෙන වර්ෂය සඳහා වූ වාර්ෂික මූල්‍ය විසර්ජනයන් මණ්ඩලයේ පරිශීලනය සඳහා පිළියෙළ කිරීම ; සහ

(ඉ) කළින් කලට විශ්වවිද්‍යාලය නියම කළ හැකි ආකාරයෙන්, ස්වරූපයෙන් හා විස්තර අඩංගු කරමින්, විද්‍යායතනයේ ක්‍රියාකාරකම් පිළිබඳව වූ වාර්ෂික ගිණුම් ප්‍රකාශයක්, ව්‍යාපාරික සැලැස්මක් හා සංඛ්‍යා දත්ත පිළියෙළ කිරීම

අධ්‍යක්ෂවරයාගේ වගකීම විය යුතු ය.

(3) ඉහත(2) අනුඡේදයේ විධිවිධානයන්හි කුමක් සඳහන්ව තිබුණද, විශේෂිත කාර්යයන් සඳහා වූ ප්‍රදානයන්ගෙන් හෝ විශේෂිත වැය විෂයයන් සඳහා වූ පරිත්‍යාග ආදියෙන් ලැබෙන කවර හෝ ආදායමක් වුවද විද්‍යායතනයේ ගිණුම්වල වෙනම ගිණුම්ගත කරනු ලැබිය යුතු වන අතර, එම ආදායමෙන් විද්‍යායතනයේ පොදු කාර්යයන් සඳහා ගෙවීම හෝ එක් එක් ප්‍රදානය හෝ පරිත්‍යාගය මගින් අරමුණු කරන ලද කාර්යය හෝ වැය විෂය හැර වෙනත් කාර්යයක් හෝ වැය විෂයයක් සඳහා වැය කිරීම නොකළ යුතු ය.

(4) විද්‍යායතනයේ ගිණුම් පොත් විද්‍යායතනයේ කාර්යාලයේ තබා තිබිය යුතු ය

17. (1) විද්‍යායතනයේ මූල්‍ය වර්ෂය ලිත් වර්ෂයම විය යුතු ය.

(2) අධ්‍යක්ෂවරයා විගණකාධිපතිවරයා ලවා විද්‍යායතනයේ එක් එක් වර්ෂය සඳහා වූ ගිණුම් විගණනය කරවා ගත යුතු ය.

(3) විගණනය කරන ලද ගිණුම්වල හා වාර්ෂික වාර්තාවේ පිටපතක් බැගින් අධ්‍යක්ෂවරයා විසින් වාර්ෂිකව විශ්වවිද්‍යාලය වෙත සහ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

18. (1) මණ්ඩලය විසින් විශ්වවිද්‍යාලයේ අනුමැතිය ඇතිව පත් කරනු ලබන්නා වූද, මණ්ඩලය වෙත පැවරී ඇති බලතල, රාජකාරි හා කාර්යයන් කාර්යක්ෂම ලෙස ක්‍රියාවේ යෙදවීම, සිදු කිරීම හා ඉෂ්ට කිරීම සඳහා අවශ්‍ය වෙතැයි එය සළකන්නා වූද නිලධාරීන්, ආචාර්යවරුන් හා වෙනත් පරිපාලන නිලධාරීන් සහ සේවකයින් ගෙන් විද්‍යායතනයේ කාර්ය මණ්ඩලය සමන්විත විය යුතු ය. කෙසේ වුවද, කළමනාකරණ මණ්ඩලය සංස්ථාපනය කරනු ලබන තෙක් වූ විද්‍යායතනයේ මුල් පත් කිරීම් විශ්වවිද්‍යාලය විසින් සිදු කෙරෙනු ඇත.

(2) විද්‍යායතනයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් අධ්‍යක්ෂවරයාගේ විධානයට හා විනය පාලනයට යටත් විය යුතු ය.

19. මෙම නියමාවලිය තුළ, පද සම්බන්ධය මගින් අන්‍යාර්ථයක් අවශ්‍ය හෝ නියම කරනු ලැබුව හොත් හැර,

''පනත'' යන්නෙන් 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනත අදහස් කෙරේ.
''උචිත සාධනපත්‍රය'' යන්නෙන් පනත යටතේ සාදන ලද කවර හෝ ආඥාපනතක්, ව්‍යවස්ථාපිතයක්, අතුරු නීතියක්, රෙගුලාසියක් හෝ රීතියක් අදහස් කෙරේ.
''පාලක මණ්ඩලය'' යන්නෙන් විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය අදහස් කෙරේ.
''කර්මාන්තය'' යන්නෙන් ඉදිකිරීම් හෝ නිෂ්පාදනයේ හෝ අන් කවර හෝ තාක්ෂණ ක්ෂේත්‍රයක හෝ සේවා අංශයක නියැළී සිටින සංවිධාන අදහස් කෙරේ.
''බලපත්‍රලාභී වාණිජ බැංකුවක්'' යන්නෙන් 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථය තුළට ගැනෙන බලපත්‍රලාභී වාණිජ බැංකුවක් අදහස් කෙරේ.
''ආචාර්යවරයා'' යන්නෙන් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු, සහාය මහාචාර්යවරයකු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු හෝ කථිකාචාර්යවරයකු අදහස් කෙරේ.

*පරිශිෂ්ටය :*

1. අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනය, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය
2. කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනය, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය
3. මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනය, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය
4. රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනය, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය
5. යාපනය විශ්වවිද්‍යාල විද්‍යායතනය, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

10-769

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.